# මැදගම ප්‍රාදේශීය සභාව

## <u>ප්‍රසම්පාදන දැන්වීමයි</u>

මැදගම ප්‍රාදේශීය සභාව සතු පහත උපලේඛනයේ සඳහන් දේපල **2025.01.01** දින සිට**2025.12.30**දින දක්වා වූ කාලයට බදු දීම මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන අයදුම්පත් මා විසින් කැඳවනු ලැබේ.

* ප්‍රසම්පාදන අයදුම්පත් නිකුත් කිරීම - **2024.11.29** දින සිට **2024.12.19** දින ප.ව.**12.30** දක්වා.

* ප්‍රසම්පාදන අයදුම්පත් භාර ගැනීම -**2024.12.19** ප.ව **1.30** දක්වා.

* ප්‍රසම්පාදන අයදුම්පත් විවෘත කිරීම- **2024.12.19** දින ප.ව.**02.00**ට.

*ප්‍රසම්පාදන අයදුම්පත් ලබාගැනීමේදී ස්වකීය ජාතික හැදුනුම්පත/ රියදුරු බලපත්‍රය/ විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත්කළ යුතු අතර, පදිංචිය සනාථ කිරීම පිණිස මෑතකදී ලබාගත් ග්‍රාමසේවා සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. මෙම සභාව සමඟ ගිවිසගත් බදු ගිවිසුම් උල්ලංඝණය කර අසාධු ලේඛනගත වූ අයට ප්‍රසම්පාදන අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

*ලබා ගන්නා ලද ප්‍රසම්පාදන ඉල්ලුම්පත් සම්පූර්ණ කර මුල් පිටපත හා අනුපිටපත යනුවෙන් නම් කොට වෙන වෙනම කුඩා කවර දෙකක දමා එම කවර දෙකම එකම කවරයක් තුලට බහා එම කවරය මුද්‍රා තබා **"සභා ලේකම්,මැදගම ප්‍රාදේශීය සභාව, මැදගම."** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය හැකි අතර, අතින් ගෙනවිත් භාර දෙන්නේ නම් සභාවේ තබා ඇති ප්‍රසම්පාදන පෙට්ටියට දැමිය යුතුය. ප්‍රසම්පාදන ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ ඔබ <u>බදු ගැනීමට බලාපොරොත්තු වන දේපලහි නම සඳහන්කර කුලියට ගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම</u> යනුවෙන් සඳහන් කර තිබිය යුතුය. ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

* සාර්ථක ප්‍රසම්පාදනකරු තෝරාගත් මොහොතේම ආරක්ෂිත ඇප තැන්පත් ලෙස ප්‍රසම්පාදනයේ සම්පූර්ණ වටිනාකමින් 3/12ක් ගෙවිය යුතු අතර ගිවිසුම අත්සන් කිරීම සඳහා පැමිණිය යුතු දිනය එදිනට දැනුම් දෙනු ඇත.එදින ගිවිසුම අත්සන් නොකළහොත් කලින් ගෙවන ප්‍රසම්පාදන ඇප තැන්පත් මුදල සභාව සතු කරනු ලැබේ.ගිවිසුම් අත්සන් කිරීමේදී ප්‍රසම්පාදන මුදල සඳහා රුපියල්දාහකට හෝ ඉන් කොටසකට රුපියල් 10 බැගින් (එනම් 1%) මුද්දර ගාස්තු ගෙවිය යුතුය.

*කිසියම් ප්‍රසම්පාදනයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම, මැදගම ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන මණ්ඩලයේ තීරණය වන අතර, කිසියම් ප්‍රසම්පාදනයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ අයිතිය ප්‍රසම්පාදන මණ්ඩලය සතුවේ.

වැඩි විස්තර සඳහා 055-2266474 දුරකථනයෙන් විමසීමෙන් හෝ කාර්යාලයට පැමිණ විමසීමෙන් දැනගත හැකිය.